කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක වසර (08) සතුටුදායක ස්ථිර සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

හෝ

(ඇ) උසස් අධ්‍යාපන ආයතනයක විද්‍යාගාර සේවකයකු වශයෙන් වසර (15) ක සතුටුදායක ස්ථිර සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

**සටහන :**

බඳවාගනු ලබන තැනැත්තන් ප්‍රථමයෙන් වසර (03) ක පුහුණුවීමේ කාලසීමාවකට යටත්ව රු.31,625.00 ක ස්ථාවර මාසික වැටුපක් මත පුහුණුවන කාර්මික නිලධාරීන් වශයෙන් පත් කරනු ලැබේ. පුහුණුවීමේ කාලය අවසන් වීමෙන් පසු විද්‍යාගාර කටයුතු පිළිබඳ නිපුණත්වය,භාණ්ඩ ඇණවුම් කිරීම,තොග පොත් පවත්වාගෙන යාම සහ ඉංග්‍රීසි භාෂාවෙන් යතුරු ලිවීම පිළිබඳ ප්‍රවීණතාවයක් ලබා ගත් සේවක භවතුන් තනතුරේ තහවුරු කර කාර්මික නිලධාරී (II ශ්‍රේණිය, 'ආ' ඛණ්ඩය) තනතුරට පත් කරනු ලැබේ.

- සුදුසුකම් 1 (ආ) සහ (ඇ) යටතේ බඳවා ගැනීම ඇබෑර්තු සංඛ්‍යාවෙන් 25% ක් නොඉක්මවිය යුතුය.

**තෝරා ගැනීම :** අභියෝගතා පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

වැටුප් ක්‍රමය: රු. 31,625.00-7x300;10x355-37,275.00 [UMT1(IIIA)] (මාසික) වැටුප් පරිමාණය හිමි වේ.
මෙම වැටුප් කොමිෂන් සභා චක්‍රලේඛ අංක 17/2016 (V) අනුව 2020 වර්ෂයට අදාළ වැටුප් පරිමාණය වේ. මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.

---

**03. තාක්ෂණික නිලධාරී (තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ) (III ශ්‍රේණිය) - Technical Officer (ICT) (Grade III)**

**සුදුසුකම්:**

1. අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් ඕනෑම විෂය ධාරාවකින් එක් වරකදී විද්‍යා විෂයයන් තුනක් එක් වරකදී සමත්ව තිබීම.

සහ

2. තෘතික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මගින් පිළිගත් කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයක් විසින් හෝ තොරතුරු සන්නිවේදනය හා බහු මාධ්‍ය තාක්ෂණය/තොරතුරු සන්නිවේදන තාක්ෂණය/තොරතුරු තාක්ෂණය යන ක්ෂේත්‍රයකට අදාළව පිළිගත් ආයතනයක් විසින් නිකුත් කරනු ලැබූ N.V.Q. 5 වෙනි මට්ටමට නො අඩු නිපුණතා සහතික පත් හෝ වෙනත් සමාන සුදුසුකමක් ලබා තිබීම.

ඉහත දක්වා ඇති සුදුසුකම්වලට අමතරව තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයට අදාල ඊකියා පළපුරුද්දක් සහිත අයදුම්කරුවන් කෙරෙහි විශේෂ ප්‍රමුඛතාවය හිමි වනු ඇත.

**තෝරා ගැනීම :**
ලිඛිත පරීක්ෂණයක් සහ/හෝ ප්‍රායෝගික පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

**වැටුප් පරිමාණය:**
රු.31 ,625-7x300;10x355-37,275 (U-MT 1(IIIA)) (මාසික) වැටුප් පරිමාණය හිමි වේ.

මෙම වැටුප් කොමිෂන් සභා චක්‍රලේඛ අංක 17/2016 (V) අනුව 2020 වර්ෂයට අදාළ වැටුප් පරිමාණය වේ. මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.

---

**04. ශ්‍රව්‍ය දෘෂ්‍ය කාර්මික නිලධාරී (II ශ්‍රේණිය) – Audio Visual Technical Officer (Grade II)**

**සුදුසුකම්:**

1. (අ) විවෘත විශ්වවිද්‍යාලයේ තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාව හෝ ජාතික ආධුනිකත්ව මණ්ඩලය විසින් 1975 වසරේ සිට නිකුත් කළ විශේෂ ඉංජිනේරු ආධුනිකත්ව සහතිකය හෝ 1989 වසරේ සිට නිකුත් කළ ඉංජිනේරු කාර්මික ශිල්පීන් සඳහා වූ ජාතික ඩිප්ලෝමාව හෝ ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව හෝ විද්‍යුත් හෝ බලශක්ති ක්ෂේත්‍රයේ " සිටි ඇන්ඩ් ගිල්ඩ්ස් " අවසාන සහතිකය සමඟ අදාල වීඩියෝ වැඩ කටයුතු පිළිබඳව එක් වර්ෂයක පළපුරුද්ද

හෝ

(ආ) අධ්‍යාපන තාක්ෂණය පිළිබඳව හෝ ශ්‍රව්‍ය දෘෂ්‍ය ශිල්පීය ක්‍රම පිළිබඳව පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ බහු තාක්ෂණික ආයතනයකින් ලබා ගත් දෙවුරුදු ඩිප්ලෝමා සහතිකය සමඟ වීඩියෝ කටයුතු පිළිබඳව එක් වර්ෂයක පළපුරුද්ද

හෝ